රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 221

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1983 ජූලි මස 4 වැනි දින.

සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

1. උසස් බලධරයන්ට උපදෙස් දීම පිළිබඳව
රාජ්‍ය ගිණුම් කමිටුවේ නිර්දේශයන්.

2. විනයානුකූල කටයුතු හා ආයතන සංග්‍රහය.

(1) 1979 පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 11 මගින් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ රාජ්‍ය ගිණුම් කමිටු වාර්තාවේ 35 වන වගන්තියෙහි උද්ධෘතයක්, ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා පහත දැක්වේ.-

"(මේ සම්බන්ධයෙන්) අමාත්‍යාංශ ලේකම්වරුන් සහ/හෝ අනෙකුත් නිලධාරීන් තම ප්‍රධානීන්ට උපදෙස් දෙන ඕනෑම අවස්ථාවක, එවැනි උපදෙස් අදාළ බලධාරීන් විසින් පිළිගනු ලැබුවත් නැතත් ඒ ගැන නොසලකා පොදුවේ ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා ලිඛිතව වාර්තාගත කර තැබිය යුතු යයි ද ඔබේ කාරක සභාව නිර්දේශ කරයි."

(2) 1983.04.12 දිනැති අංක 218 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 8 වන ඡේදය, ඒ වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ.-

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 ඡේදය යටතේ විශ්‍රාම ගැන්වීම.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන ඡේදය යටතේ විශ්‍රාම ගන්වා ඇති නිලධරයෙකු සම්බන්ධයෙන් පවත්වන විනයානුකූල පරීක්ෂණ අවසානයේදී එහි නියමන විශ්‍රාම වැටුපට බලපෑ යුතු ආකාරය පිළිබඳව විධානයක් දීමට බලය ඇත්තේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ම පමණක්ය. ඔහුට එසේ කිරීමට හැකිවන පරිදි අදාළ චෝදනා සම්බන්ධයෙන් නිලධරයාට අඩුවමක් වශයෙන් හෝ නොගෙවූ වැටුප් නොගෙවා සිටීමක් වශයෙන් හෝ අධිභාරයක් වශයෙන් හෝ පනවා ඇති සම්පූර්ණ මූල්‍යමය හා සේවා අවාසි සියල්ලම පිළිබඳව වාර්තාවක් සමග, සිරිත් පරිදි ඔහුගේ විශ්‍රාම වැටුප් ලියවිලි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට ඉදිරිපත් කළ යුතුය. එවිට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප නොගෙවා සිටීම හෝ අඩු කිරීම ගැන නියෝගයක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ලබා ගන්නවා ඇත.

මුදල් රෙගුලාසි යටතේ ප්‍රධාන ගණන නිලධරයා වශයෙන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්ට හෝ ගණන නිලධරයා වශයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානයාට හෝ ඇති බලතල අනුව ගත යුතු යයි සැළකෙන පියවර ගැනීම එකී බලධරයන් භාර කටයුත්තකි. වැඩ තහනම යටතේ සිටි කාලය තුළ නොගෙවූ වැටුප් ගෙවීම හෝ නොගෙවීම පිළිබඳ තීරණයක් ගැනීම විනය බලධරයා සතු කාර්යයකි.

*Siriwardhana*
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.